# දෙහිඕවිට අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2024 8 ශ්‍රේණිය

**ගණිතය I , II** | **කාලය පැය දෙකයි**

i - කොටස

★ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. 1න් පටන් ගෙන ඔත්තේ සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට පද පිහිටි සංඛ්‍යා රටාවේ සාධාරණ පදය ලියා දක්වන්න.

02. අගය සොයන්න; $(-2)^3$

03. අගය සොයන්න; $9.45 \times 1000$

04. සුළු කරන්න; $\frac{3}{4} \times 12$

05. 20% භාගයක් ලෙස දක්වන්න.


06. එක්තරා මුදලක් නසීර් හා සුනෙත් අතරත් සුනෙත් හා රවී අතරත් බෙදාගත් අනුපාත පහත දැක්වේ.තිදෙනා අතර මුදල් බෙදාගත් අනුපාතය තිත් ඉරි මත ලියා දක්වන්න.

| නසීර් | : | සුනෙත් | : | රවී |
|---|---|---|---|---|
| 3 | : | 4 | | |
| | | 3 | : | 5 |
| ........ | : | ......... | : | .......... |

07. රු. 5000 ක් ණයට ගත් පුද්ගලයෙකු වසරකට පසු පොලී වශයෙන් රු. 500 ක් ගෙවයි නම්, එම පොලිය ණය මුදලේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.


08. සුළු කරන්න; $(-2) - (-5)$

09. $\frac{15}{7}$ හි පරස්පරය ලියා දක්වන්න.

10. 


දී ඇති $ABC$ ත්‍රිකෝණයේ වර්ගඵලය $36\ cm^2$ නම් $x$ හි අගය සොයන්න.

11. රූපයේ පරිමිතිය සොයන්න.




12. සුළු කරන්න.

| $t$ | $kg$ |
|---|---|
| 12 | 320 |
| | $\times 6$ |

13. ග්‍රිනිච් නගරයේ වේලාව පෙරවරු 6.30 වන විට ශ්‍රී ලංකාවේ වේලාව කීයද?

14. විසඳන්න; $3(x-4)=9$

15. සුළු කරන්න; $(-3x)\times(-4y)$


16. $px-yx-2x$ සාධක දෙකක ගුණිතයක් ලෙස දක්වන්න.


17. $70^0$ හි අනුපූරකයේ අගය සොයන්න.

18. ද්වාදසතලයක,
   (i) මුහුණත් ගණන කීයද?

   (ii) මුහුණතක හැඩය කුමක්ද?

19. $ABCD$ චතුරස්‍රයේ බාහිර කෝණ හතර $x^0, x^0, 70^0, 80^0$ වේ. $x$ හි අගය සොයන්න.




20. 

සවිධි ෂඩස්‍රයක භ්‍රමක සමමිති සනය කීයද?

$ii$ කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. ($a$) පහත දැක්වෙන්නේ 1 න් පටන්ගෙන ත්‍රිකෝණ සංඛ්‍යා ආරෝහණ පිළිවෙලට පද පිහිටන සංඛ්‍යා රටාවයි.

1, 3, 6, 10, . . .

(i) ඉහත රටාවේ ඊළඟ පද දෙක සොයන්න. (ල. 02)

(ii) සාධාරණ පදය $9n$ වන සංඛ්‍යා රටාවේ,

(අ) මුල් පද දෙක ලියා දක්වන්න. (ල. 02)

(ආ) අටවන පදය සොයන්න. (ල. 01)

(ඇ) 72 මෙම සංඛ්‍යා රටාවේ කීවෙනි පදයද? (ල. 01)

($b$) (i) සුළු කරන්න; $1.2 \times 0.8$ (ල. 02)

(ii) සුළු කරන්න; $3.72 \div 1.2$ (ල. 03)

($c$) $2^3x^3$ බලවල ගුණිතය, ගුණිතයක බලයක් ලෙස දක්වන්න. (ල. 01)

02. ($a$) (i) සුළු කරන්න; $1\frac{1}{4} \times \frac{4}{15}$ (ල. 03)

(ii) සුළු කරන්න; $2\frac{1}{4} \div 1\frac{1}{5}$ (ල. 03)

($b$) (i)

$225 = 3 \times 3 \times 5 \times 5$
$= (3 \times 5) \times (3 \times ....)$
$= (.... \times 5)^2$
$\sqrt{225} = ........$

$\sqrt{225}$ අගය සෙවීමට අදාල පියවර පහත දැක්වේ. ඔබගේ උත්තර පත්‍රයේ එය පිටපත් කරගෙන හිස්තැන් සම්පූර්ණ කරන්න. (ල. 03)

(ii) වර්ගඵලය $324\ m^2$ වූ සමචතුරස්‍රාකාර මල් පාත්තියක පැත්තක දිග සොයන්න. (ල. 03)

03. ($a$) සුජිත් රු. 24 000 ක් යොදා ජනවාරි 01 දින ව්‍යාපාරයක් අරඹයි. සජිත් රු. 40 000 ක් යොදා අප්‍රේල් 01 දින ඊට හවුල් විය.වසර අගදී ව්‍යාපාරයෙන් ලද ලාභය ඔවුන් යෙදූ මුදලත් කාලයත් සැලකිල්ලට ගෙන බෙදාගනු ලබයි.

(i) දෙදෙනා අතර ලාභය බෙදා ගන්නා අනුපාතය සොයන්න. (ල. 03)


(ii) වසර අගදී ව්‍යාපාරයෙන් ලද ලාභය රු. 22 500 ක් නම්, සජිත් ලැබූ ලාභ මුදල සොයන්න. (ල. 03)

($b$) (i) මුල් ප්‍රමාණය 1ක් වූ විට 0.25 ක මුල් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ල. 02)

(ii) ටැංකියක තිබූ ජලය $150l$ කින් එහි වූ කාන්දුවක් නිසා දිනක දී 8% ක් අපතේ යන ලදී. අපතේ ගිය ජල ප්‍රමාණය ලීටර කීයද? (ල. 02)

(iii) ටැංකියේ මුලින් තිබූ ජල ප්‍රමාණය ටැංකියේ ධාරිතාවෙන් 20% ක් නම්, ටැංකියේ ධාරිතාව ලීටර කීයද? (ල. 02)

04. ($a$)




$ABCDEFG$ තල රූපයේ $CB = BG = GF$ වේ. මෙම තල රූපය $ABG$ ත්‍රිකෝණාකාර කොටසකින් හා $CDEF$ සෘජුකෝණාස්‍රාකාර කොටසකින් සමන්විත සංයුක්ත තල රූපයකි.


(i) $BG$ දිග කොපමණද? (ල. 01)

(ii) $ABG$ ත්‍රිකෝණාකාර කොටසේ වර්ගඵලය සොයන්න. (ල. 02)

(iii) $CDEF$ සෘජුකෝණාස්‍රාකාර කොටසේ වර්ගඵලය සොයන්න. (ල. 02)

(iv) සංයුක්ත තල රූපයේ මුළු වර්ගඵලය සොයන්න. (ල. 02)

$(b)$ රූපයේ දැක්වෙන්නේ ඝනකාභ හැඩති ලී කුට්ටියකි.
දී ඇති මිනුම් අනුව එහි බාහිර මුළු පෘෂ්ඨ වර්ගඵලය සොයන්න. (ල. 05)




05. $(a)$ $A$ යනු 1 ත් 10 ත් අතර 3 හි ගුණාකාර කුලකය වේ.

(i) අවයව සඟල වරහන් තුළ ලිවීමෙන් $A$ කුලකය ලියා දක්වන්න. (ල. 02)

(ii) $n(A)$ අගය කීයද? (ල. 01)

(iii) $10 \in A$ ප්‍රකාශය සත්‍යවේද?එසේ නොවේ නම්,එය නිවැරදි කර ලියා දක්වන්න. (ල. 02)

(iv) $B = \{$1ත් 3ත් අතර ඔත්තේ සංඛ්‍යා$\}$ ලෙස තවත් කුලකයක් දී ඇත්නම්,
$n(B) = 0$, $B = \emptyset$, $B = \{\ \}$, $A = \emptyset$ අතරින් අසත්‍ය ප්‍රකාශ/ ප්‍රකාශය තෝරා ලියන්න. (ල. 02)

$(b)$ 2024-07-26 දින ශ්‍රී ලංකාවේ වේලාව ප. ව. 9.45 වන විට,

(i) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ වේලාව ගණනය කරන්න. (ල. 02)

(ii) ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයේ දිනය කවදාද? (ල. 03)
( ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නගරය අයත් කාල කලාපය +10 වේ.)


06.$(a)$(i) $\frac{2}{5}x - 1 = 7$ විසඳන්න. (ල. 03)

(ii) සිසුවෙක් ළඟ රු. 5 කාසි $x$ ප්‍රමාණයක් හා රු. 2 කාසි 10 ක් තිබිණ. එම මුදලින් අඩක් රු. 25 කි. මෙම තොරතුරු ඇසුරින්, සමීකරණයක් ගොඩනගා එය විසඳීමෙන් $x$හි අගය සොයන්න. (ල. 04)

$(b)$ (i) $5(2x - 3y) - 3\,(x - 2y)$ වරහන් ඉවත්කර සුළු කරන්න. (ල. 03)


(ii) $x = 2\,, y = -1$ විට ඉහත ප්‍රකාශනයේ අගය සොයන්න. (ල. 02)

07. $(a)$




රූපයේ දැක්වෙන තොරතුරු අනුව $x$ හි අගය සොයන්න. (ල. 03)

$(b)$





$AB, CD$ සරල රේඛා $O$ හි දී ඡේදනය වේ. දී ඇති තොරතුරු අනුව,

(i) $a$ හි අගය සොයන්න. (ල. 02)

(ii) $b$ හි අගය සොයන්න. (ල. 02)

$(c)$




$ABCD$චතුරස්‍රයකි. $AB$ පාදය $E$ දක්වා දික්කර ඇත.
දී ඇති තොරතුරු අනුව,

(i) $x$ හි අගය සොයන්න. (ල. 02)

(ii) $y$ හි අගය සොයන්න. (ල. 03)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න




කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න